01. ඔබ විසින් මේ වන විටත් සකසා ඇති / සකසන මෘදුකාංගය නිර්මාණය කිරීමේදී දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ මෘදුකාංග අත්පොත් අධ්‍යයන කරන ලෙස දන්වමි.

02. එම ඇගයුම සඳහා පැමිණීමේදී ඔබ ආයතනය විසින් සමුපකාර සමිති සඳහා ස්ථාපිත කිරීමට යෝජිත මෘදුකාංගය බාගත කරන ලද පරිගණකයක් රැගෙන ආ යුතු අතර, එකී මෘදුකාංගය ධාවනය කර පෙන්විය යුතුය. එසේම ඇගයුම් මණ්ඩලය විසින් ලබා දෙන උපකල්පිත ගිණුම් කිහිපයක් එම මෘදුකාංගයේ ඇතුළත් කර ගිණුම් පියවරයන් පැහැදිලිව පෙන්විය යුතුය.

03. මීට අමතරව ඇගයුම් මණ්ඩලය විසින් එම අවස්ථාවේ සිදු කරන සම්මුඛ පරීක්ෂණය සඳහා ද අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ඔබගේ වගකීමක් බවත්, ඔබව මෘදුකාංග සැපයුම් ආයතනයක් ලෙස තෝරා ගතහොත් ඒ සඳහා විධිමත් ගිවිසුමකට ආයතනයේ සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සමඟ එළඹිය යුතු බවත් අවධාරණය කරමි.

04. නියමිත දින නියමිත වේලාවට ඉදිරිපත් නොවීම, විධිමත් පරිදි තොරතුරු ඉදිරිපත් නොකිරීම, සමුපකාර දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පරිගණක මෘදුකාංගය සංවර්ධනය නොවීම වැනි හේතූන් නිසා දකුණු පළාතේ සමුපකාර සමිති සඳහා මෘදුකාංග සැපයුම් ආයතනයක් ලෙස ඔබ ආයතනය ලියාපදිංචි නොකිරීමට හේතුවිය හැකි බැවින් ඒ පිළිබඳව ද සැලකිලිමත් වන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.